# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2349/39 – 2022 සැප්තැම්බර් මස 15 වැනි සිකුරාදා – 2023.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 175 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2021/CEB/338.
ප්‍රා.ලේ.ගේ යොමු අංකය: 09/03/01/2021/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම් ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, දිවුලපිටිය.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,යටිගහ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 46, පහල මඩිතියවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොත්තේගෙදර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක GA/DIV/2022/129 සහ 2022.12.14 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර "A" - මඩිතියවෙල වත්ත - ප්‍රමාණය: හෙක්. 0.0207**

උතුරට: ලංකා විදුලිබල මණ්ඩලය හිමිකම් කියන මඩිතියවෙල වත්ත සහ පාර; නැගෙනහිරට: පාර; දකුණට: කැබලි අංක B, පී.කේ.පත්මනාථ හිමිකම් කියන මඩිතියවෙල වත්ත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ලංකා විදුලිබල මණ්ඩලය හිමිකම් කියන මඩිතියවෙල වත්ත.

02. **කැබලි අක්ෂර "B" - මඩිතියවෙල වත්ත - ප්‍රමාණය: හෙක්. 0.0894**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, ටී.නන්දන මෙන්ඩිස් සහ තවත් අය හිමිකම් කියන මඩිතියවෙල වත්ත කැබලි අංක A සහ පාර; නැගෙනහිරට: පාර සහ මාර්ගය (ප්‍රදේශීය සභාව); දකුණට: පාර සහ මාර්ගය (ප්‍රදේශීය සභාව); බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, ටී.නන්දන මෙන්ඩිස් සහ තවත් අය හිමිකම් කියන මඩිතියවෙල වත්ත කැබලි අක්ෂර A.

EOG 07 - 0117